ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
ENGLAND
*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
***Editor*** : **Daya Ananda Ranasinghe**

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam



## අවුරුදු 60 කුත් ගියා.... ඉතින්....

ශ්‍රීලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයෙන් නිදහස ලබා ගිය සතියේ 4 වෙනිදාට වසර හැටක් සම්පූර්ණ විය. ඒ දෙස විවිධාකාරයෙන් බැලූ අය සිටිති. සමහරුන්ට එය සුද්දාගේ යකඩ සපත්තුවට පෑගී සිටි ලාංකිකයා නැගිට පිට කොන්ද කෙලින්කර ගැන්මකි. සමහර අයට ස්වදේශිකයන් අතට පාලන බලය ලැබීමේ ජයග්‍රහණයකි. තවත් අයෙකුට එය අධිරාජ්‍යවාදයට ගැසූ කම්මුල් පහරකි. තවත් අයට සුද්දාගේ කාලෙ තිබුණාට වඩා රට ආපස්සට යාමකි. තවත් අය කියන විදියට සුද්දාගෙන් මුදවා ගෙන රට ලාංකික පවුල් දෙකක භුක්ති යට සතුකර ගැනීමකි.

හැම අවුරුද්දකම පෙබරවාරි මාසය තුළ ලංකාවට නිදහස ලැබීම ගැන ඉහත සඳහන් ආකාරයේ කතා අසන්නට ද මාධ්‍යයෙන් කියවන්නටද ලැබේ. එය මතුවටත් ලබන සෑම අවුරුද්දකදී ඒආකාරයෙන්ම කෙරෙනවා ඇත.

දියුණුව යයි කියන්නේ යමක් යහපත් අතට වෙනස්වීමයි. පරිහාණිය හෙවත් පිරිහීම එය අනෙක් අතට ගමන්කිරීමයි. ශ්‍රී ලංකාව නොසෑහෙන්න වෙනස් වී ඇති බව කලකට පසු ඒ දේශයට යන කෙනෙකුට වැටහෙනවා ඇත. එහිම ජීවත්වන අයට නම් ඒ වෙනස එතරම් නොතේරෙන්නටද පුලුවන.

අප මෙන්ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව තිබුණු ඉන්දියාව නිදහස ලබා වසර හැට එකකි. ඔවුන් නිදහස් වූයේ අපට වඩා අවුරුද්දකට කලිනි. භූමි ප්‍රමාණයෙන් ද ජනගහනයෙන් ද එහි ජීවත්වන විවිධාකර ජනකොටස් අතින් ද බැලුවහොත් ඉන්දියාව අපට වඩා පාලනය කිරීමට අමාරු රටකි. එහෙත් පසුවුණු වසර හැට තුළ ඉන්දියාව ආර්ථික තාක්ෂණික හා ස්වයං පෝෂණය අතින් ලබා ඇති තැන අපට වඩා ගව්ගණනක් දුර ය. අද එය එම කලාපයේ බලවතා ය. එහි ද ත්‍රස්තවාදය ඇත. වාර්ගික යුද්ධ ඇත. දූප්පත්කම ඇත. ගංවතුර ඇත. නියඟ ඇත. එහෙත් ඔවුන් ඒබව කියමින් ලොවවටා හිඟමනේ යන්නේ නැත. ඔවුන්ගේ ආර්ථික ගැටළු හා ප්‍රශ්න විසඳා ගන්නට ඔව්හු දනිති.

වඩාත්ම ඇදගිය යුතු ඉන්දිය ලක්ෂණය නම් ඒ ජනතාව තම සංස්කෘතියෙන් බැහැර නොවී සංකර නොවී සිටීමයි. සාරිය හා කදාර් රෙද්ද අඳින්නට වසර හැටකට පසුත් ඔවුන් ලැජ්ජා නැත. හින්දි මව් බසට පයින් ගසා ඉංගිරිසි කෑලි දමා බස කෙලසන්නේ නැත. ගොවිතැන ඉවතලා පිටරටින් වපාති ගේනතුරු බලාගෙන ඉන්නේ නැත. තම දේශයට ඇති අචල භක්තිය ආදරය ඔවුන් තුළ බිඳකුදු සෙලවී නැත. මේ සියල්ලත් සමග අද නවීන විද්‍යාව, තාක්ෂණය, කර්මාන්ත අතින් ඔවුන් ඉතා ඉදිරියෙනි. කරට කර තබා අපට ඒ අහලක වත් සිටින්නට පුළුවන් කමක් නැත.

ඉන්දියාව ගැන ඉහතින් කී සියල්ල හා දැන් අපේ රට සසඳා බලන්න. එවිට අපේ වසර හැටක නිදහසේ තරම ඔබට පැහැදිලිව පෙනෙනවා ඇත. රටක් සමෘධිමත් වන්නේ රටේ ජනයා තම රටට සංස්කෘතියට ආදරයක් ඇත්නම් පමණි. එය නැත්නම් ඒ රට ගැන ඉතින් කතාකරලා වැඩක් නැත.

## නැවුම්බව ගෙනෙන නවම්මහ

හිම වැටෙන සීතල කාලය ගෙවී මල් පිපෙන වසන්තය උදාවෙන පෙර නිමිති පහළවෙන අන්තර්වාර කාලය යෙදෙන්නේ සාමාන්‍යයෙන් ඉංග්‍රීසි පෙබරවාරි මාසයට වැටෙන සිංහළ නවම් මහේදීයි. වසන්තයේ පෙර නිමිති කියන ඩැපඩිල් මල් පිපෙන්නෙත් මේ කාලෙදියි. පෙබරවාරි මාසයට වැටෙන චීන අළුත් අවුරුද්දෙ සැරසිලි කෙරෙන්නෙ ඩැපඩිල් මල් වලිනුයි.

ගිම්හානය ගෙවීමත් සමග කොළ හැලී සීත කාලයෙදි නිදාගත් ගස්වැල් වල අළුත් දළු මල් පිපෙන්නට ආරම්භවීම සොබාදහමේ නව කර්මාන්තයක් ආරම්භවීම ලෙසයි පැරණියන් දැක තිබෙන්නෙ. අළුත් කර්මාන්ත කියන තේරුම දෙන නවකම් යන්නෙන් නිපන් නවම් යන්න ඒ මාසයට ලැබී තියෙන්නෙ ඒ නිසා විය යුතුයි. නොව පැරණිය වන රමණීය සොබාදහම නිරතුරුවම අළුත් අළුත් මුහුණුවර ගන්නෙ මෙබඳු නව කර්මාන්ත නමැති නවකම් නොහොත් නවම් නිසයි.

නවම් මහෙන් පසු උදාවෙන මැදින් මහේදි මහ කන්නයේ අස්වැන්න නෙලා ගන්නට පෙර එළඹෙන විවේක සම යෙදි පැරණි සිංහලයන් නව කර්මාන්තවල යෙදුනේ නවම් මහේදියි. ශ්‍රී සම්බුද්ධ ශාසනය අළුත් මගකට යොමුවූයේත් නවම් පුර පසලොස්වක් පෝදාකයි.

බුද්ධත්වයෙන් පසු අවුරුදු විස්සක් යනතුරු භික්ෂූන් හික්මවීම සඳහා යොදාගන්නා ලද අනුශාසනා ප්‍රාතිමෝක්ෂය නොහොත් ඔවාද පාතිමොක්ඛය නවතා බුදුහාමුදුරුවන් විසින් ආඥා වශයෙන් පනවන ලද ආණා පාතිමෝක්ෂය මුල්වරට දෙසන ලද්දේ නවම් පුන් පෝ දිනකයි.

ආනා ප්‍රාතිමෝක්ෂය දෙසන තුරු පැවතුණේ ආඥා ස්වරූපයෙන් තොරව අනුශාසනා ධර්ම ස්වරූපයෙන් යුක්ත ඕවාද ප්‍රාතිමෝක්ෂය සීලය අනුව භික්ෂූන් වහන්සේලා ස්වයං සංවරයෙහි යෙදීමයි. සබ්බ පාපස්ස අකරණං, කුසලස්ස උපසම්පදා, සචිත්ත පරියො දපනං, එතං බුද්ධානුසාසනං යනුවෙන් සඳහන් වන්නේ සියළුම පාප කර්මයන්ගෙන් මිදී කුසලකර්මයන් රැස්කරමින් සිත පිරිසිදු කරගැනීම සියළු බුදුවරයන්ගේ අනුශාසනාව නිසා ඒ අනුව කායිකවත්, වාචිකවත්, මානසිකවත් සංවරවීම ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයයි. මෙය ස්වයං සංවරයක්.

භික්ෂූන් හික්මවීම සඳහා ශික්ෂා පද පැනවීම ආරම්භ වූයේ ආණා පාතිමෝක්ෂ දේශනාවත් සමගයි. භික්ෂූන් වහන්සේලා අඩමසකට වරක් පොහොය කිරීම යනුවෙන් හැඳින්වෙන විනය කර්මය සිදුකිරීම ආරම්භ වූයේ නවම්පුර පසලොස්වක් පොහෝ දිනක ආණා ප්‍රාතිමෝක්ෂය දෙසීමත් සමගයි.

අවුරුදු දෙදහස් හයසීයක් පමණ දිගු කලක් තිස්සේ භික්ෂු ශාසනය නොකැඩී පවත්වාගෙන ආ හැකිවූයේ පොහොය කිරීම නමැති විනය කර්මය ආරම්භවීම නිසයි. මේ විනය කර්මය කොමියුනිස්ට් රාජ්‍යවල පැවති හා පවතින විධියේ ස්වයං විවේචන ක්‍රමයක්. භික්ෂූන් අඩමසකට වරක් පොහොය දිනක පොහොය ගේ නම් කුටියට රැස්වී ඇසීමෙන් දැකීමෙන් හෝ සැකකිරීමෙන් දැනගත් යම්කිසි වරදක් තමාගේ වේනම් ප්‍රකාශ කරන ලෙස සංඝයාට පවරා ඒ පිළිබඳව සාකච්ඡාකර ඒ සඳහා සුදුසු පියවරක් ගැනීමට අවස්ථාව සැලසීම, සමගිව රැස්ව, සමගිව සාකච්ඡාකර, සමගිව විසිරයන අපරිහාණීය ධර්ම ප්‍රතිපදාවකි.

පොහොය කිරීම නමැති ස්වයං විවේචන ක්‍රමය මගින් කෙරෙන්නේ බුදුහිමියන් විසින් ආඥා ස්වරූපයක් ඇතුව පනවන ලද විනය රීති නමැති ආණා ප්‍රාතිමෝක්ෂයට අයත් කුමන සිල්පදයක් හෝ තම තමන්ගෙන් කඩවී ඇත්දැයි විමසා බලා ඊට සුදුසු පියවර ගැනීමයි.

බුද්ධත්වයෙන් විසිවන වසේ නවම් පුර පසළොස්වක් පෝදා බුදුහිමියන් විසින් පනවන ලද ආණාප්‍රාතිමෝක්ෂය අළුත් පාපකර්ම හා පුණ්‍යකර්ම නියම කිරීමක්. පුණ්‍යකර්ම වන්නේ පාපකර්මවලින් වැලකී සිටීමයි. මේ නව පාපකර්ම හා පුණ්‍යකර්ම සැලකිය හැක්කේ නව කර්ම නමැති නවකම් නොහොත් නවම් ලෙසයි.

පැවිද්දන් පමණක් නොව ගිහියන් පවා පොහොය දිනයට පමණක් සීමා නොවී රෑ නින්දට යන්නට පෙරත් උදෑසන අවදිවූ සැණිනුත් තම තමා කළ පව් හා පින්කම් පිළිබඳව ස්වයං විවේචනයක යෙදීම එලොව මොලොව දෙලොවටම සුබසෙත සලසන යහපත් වැඩක්. දිනපතාම තම දිවියට නවම් නොහොත් නැවුම් බවක් ඇතිකරගත හැක්කේ එවිටයි.

♦ ***සම්මානිත මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම*** **Harrow UK**

## Ven. Olande Ananda Thero
## පූජ්‍ය ඕලන්දේ ආනන්ද තෙරුන් වහන්සේ



**V**en. Olande Ananda Thero completed his 60th year on January 02.

Ven. Olande Ananda of dutch nationality has been serving the Buddhist community in Sri Lanka for three decades. For people who lead busy lives many of them being professionals, his **Pansala** in Pago - da, **Nugegoda** is a haven of peace and tranquillity.

The association with Ven. Olande Ananda Thera helped many to learn the Dhamma as well as the practice of Samatha and Vipassana Bhavana which help experience reality as it is.

He advises people who come to him for guidance to refrain from unwholesome activities and to attain, spritual development. For those who wish to attain higher level of Arya Magga, he instills great virtues such as Metta, Karuna, Muditha and Uppekka in order to establish and maintain interpersonal relations among people of different groups. His quiet voice throughout the meditation sessions give strength and courage which lead to tranquillity of mind.

He also leads Dhamma discussions which are very flexible allowing the practitioners to ask any question that may come to their minds. He invites all participants to give their own views so that there is a rich exchange of views and opinions. This is a refreshing aspect that one misses in normal Dhamma sermons. His wide knowledge of the Dhamma is evident in the erudite view he expresses simply in analysing aspects of the Buddha's teachings.

Thus we take this opportunity to extend our sincere wish to a great Bhikkhu Ven. Olande Ananda Thera on his sixtieth birth anniversary.

**May he be blessed with good health.!**

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

**කදර්ථිතස්‍යාපි ච ධෛර්‍යවෘත්තේර්**
**බුද්ධේර්විනාශො න හි සංකනීය:**
**අධ: කෘතස්‍යාපි තනූපපාතා**
**නාධ: ශිඛා යාති කදාචිදෙව**

**අර්ථය** : *නින්දා කරන ලැබුවාවූ නමුදු ධෛර්‍ය පැවතුම් ඇත්තාගේ බුද්ධියේ විනාශයක් වේයැයි සැක නොකට යුතුය. යටි දිශාවට පත් කළත් ගින්නේ දැල්ල කිසි කලෙක යටි දිශාවට නොයේ.*

**කො**තරම් හැලහැප්පිලි වලට ගොදුරු වූවත් ඉන් අධෛර්‍යයට පත්නොවී ඉදිරියට යන ධෛර්‍ය සම්පන්න පුද්ගලයෙකුගේ උසස් බව මෙම පද්‍යයෙන් මොනවට හෙළිකර ඇත. බොහෝ දෙනෙකුගේ ස්වභාවය ගැටුම් හමුවේ පසුගාමීවීම හෝ මන්දගාමීවීමයි. ඉන් සිදුවන්නේ තම ජීවිතයේ සාර්ථකබව ආපස්සට හැරීම හෝ මන්දගාමීවීමකි. නැතහොත් ජීවිතයේ අඩාලවීමක් හෝ කඩාවැටීමකි. ප්‍රශ්න හමුවේ එඩිතරව, ඉන් පසුබට නොවී උත්සාහයෙන් ඒවා ජයගැනීම බුද්ධිමතුන්ගේ ස්වභාවයයි. ප්‍රශ්න හමුවේ චංචලවී ජීවිතය අවුල්කරගැනීම බුද්ධිමත් බවේ ලක්ෂණයක් නොවේ.

එදිනෙදා ජීවිතයේ අප පසුපසින් සිට අප වටා කරකැවෙන අෂ්ටලෝක ධර්මය අපට ආවේණික ධර්මයක් සේ සිහිතබා ගත යුතුය. ලාභ මෙන් ම අලාභයන්ද, යස අයසයන්ද, ප්‍රශංසා මෙන්ම නින්දා අපහාසද, කීර්ති යශෝරාවය මෙන්ම, අපකීර්තියද ජීවිතයක උරුමයන්සේ සිතිය යුතුය. ගඟක් ගලාගෙන යනවිට හමුවන බාධා මගහැර හැඩකාරව ගලා බසින නදියක් සේ ජීවිතය ලෝක ධර්මයන්ගෙන් ඔප මට්ටම් කරගෙන සුන්දර කරගත යුතුය.

වැටෙන වැටෙන හැම මොහොතක දී ම යළි යළිත් නැගීසිටීම බුද්ධිමත්බවේ ලක්ෂණයයි. බුද්ධිය කෙනෙකුට සහජයෙන්ම ඇතිවන්නක් වුව ද තවත් කෙනෙකුට ජීවිතාවබෝධයෙන් ලැබෙන්නකි. මිළ මුදල්වලට ලබාගත නොහැකි අමිල වූ මහාර්ඝ වස්තුවකි. බුද්ධිය බුද්ධිමතෙකු සතු දෙයක් මිස එය ව්‍යවහාරික ලොව ලෞකික විෂය ධාරාවන්ගෙන් ලැබෙන විෂය දැනුමට සමකළ නොහැක්කේය. බුද්ධියෙන් අප ලබාගන්නා දේටත් වඩා බුද්ධිය මඳ බව නිසා අප්‍රමාණ ලෙස අප විඳගන්නා පාඩු ගැන කාට වුව ද සිහිපත් කරගත හැකියි.

මෙම පද්‍යයෙන් විස්තර කරන්නේ කෙතරම් නින්දා අපහාස ලැබුවත් ධෛර්‍යමත් පුද්ගලයාගේ බුද්ධිමත්බවේ විනාශයක් වේයයි කිසි විටෙකත් සැක උපදවා ගතයුතු නැති බවයි. ඔහු ඔහුගේ බුද්ධිය මෙහෙයවා නින්දා අපහාස වලින් මිදී තම කටයුතු සාර්ථක කරගන්නා බවයි. මේ සඳහා යොදාගෙන ඇති උපමාවද අප හැම දෙනාම හොඳින් දන්නා ගිනිදැල්ලයි.



මෙම උපමාව ඉතාම සරල වුවත් ඒ සඳහා කදිමට ගැලපෙන්නකි. ගිනිදැල්ල යටි අතට හැරවීමට කොතරම් උත්සාහ කළත් එය උඩු අතට හැරෙන්නාක් මෙන් යන්නයි. කොතරම් උත්සාහ කළද ගිනිදැල්ල යටි අතට හැරවිය නොහැකි ලෙසටම කොතරම් නින්දා අපහාස කළත් බුද්ධිමතෙකුගේ බුද්ධිය විනාශකළ නොහැකි බව මෙම පද්‍යයෙන් අපට ලබාදෙන ආදර්ශමත් උපදේශයයි.

♦ ***පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**

**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 0 2 0 8 3 4 8 7 7 7 2**

**Work Permits and Highly Skilled**
**Migrant Applications done.**
**We also deal with visa refusal from**
**British High Commission in Colombo**

Colombo Office
**Hegoda & Hegoda**
**100/6 Rosemead Place, Colombo 7**
**Tel. 2672432 / 0777686632**